I E S L

# ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය

## ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිය සඳහා වන අධ්‍යාපන සුදුසුකම් පිළිගැනිම පිළිබද මහජනතාව දැනුවත් කිරිම.

ඉංජිනේරු වෘත්තිය සඳහා වගකිවයුතු අග්‍රගන්‍ය ආයතනය ලෙස ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනය (IESL) ඉංජිනේරුවන් බවට පත්වීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් අදාල කාලින සහ උසස් ගුණාත්මක තත්වයන් යටතේ පවත්වාගෙන යනු ලබයි.

IESL හි ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා ගැනිම සඳහා (IESL) විසින් පිළිගත් හෝ ප්‍රතීතනය කල වසර 4 ක පුර්ණ කාලින ඉංජිනේරු උපාධියක් සාර්ථකව නිම කලයුතුය. ඉහත සාමාජික සාමාජිකාවන් හට නිශ්චිත පුහුණුව සහ අත්දැකිම් මත ඇගයීමෙන් පසුව වරලත් ඉංජිනේරු සාමාජිකත්වය ලබා ගත හැක.

2018 .05 .01 දිනට පසුව ඉංජිනේරු උපාධි පාඨමාලා හැදැරිමට ලියාපදිංචි වන අය, (IESL) හි ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා ගැනිමට පහත සදහන් මුලික සුදුසුකම් සපුරා තිබිය යුතුය.

- IESL විසින් පිළිගත් හෝ ප්‍රතීතනය කරන ලද වසර 4 ක පුර්ණ කාලින ඉංජිනේරු උපාධියක් සමග,
- අපොස උසස් පෙළ භෞතික විද්‍යා විෂය ධාරාව (සංයුත්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව) එක් වතාවකදි අවම වශයෙන් "C" සාමාර්ථ 2ක් සහ "S" සාමාර්ථ 1ක් ලෙස සමත්විම

හෝ

- අපොස උසස් පෙළ (කේම්බ්‍රිජ් හෝ එඩෙක්සෙල්) විෂය ධාරාව (සංයුත්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව) එක් වතාවකදි අවම වශයෙන් "B" සාමාර්ථ 2ක් සහ "C" සාමාර්ථ 1ක් ලෙස සමත්විම

අපොස උසස් පෙළ භෞතික විද්‍යා විෂය ධාරාව (සංයුත්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව) එක් වතාවයකදි අවම වශයෙන් "S" සාමාර්ථ 3ක් ලෙස අවම සුදුසුකම් සපුරා නොමැති 2018 .05 .01 දිනට හෝ ඊට පෙර ඉංජිනේරු උපාධි පාඨමාලා සම්පුර්ණ කර ඇති හෝ ලියාපදිංචි වි ඇති අය IESL සාමාජිකත්වය සඳහා අයදුම් කිරිමට පෙර IESL ප්‍රවේශ සුදුසුකම් විභාගය සාර්ථකව නිම කල යුතුය. ( IESL ප්‍රවේශ සුදුසුකම් විභාගය පැවැත් විම 2020 වසර දක්වා පමණි.)

මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය සහ සයිබර් අවකාශයේ විවිධාකාර ඉංජිනේරු උපාධි පාඨමාලා IESL මගින් පිළිගෙන ඇති බවට හෝ අනුමත විෂය මාලා වලට අනුකුලව සකස් කර ඇති බවට දැන්වීම් පළවන බව දැන ගැනිමට ලැබි ඇත.

ඉංජිනේරු උපාධි පාඨමාලා හැදැරිමට අපේක්ෂා කරන සිසුන් උපාධි සඳහා ලියාපදිංචි විමට පෙර අවශ්‍ය මග පෙන්විම සඳහා IESL හි උපදෙස් ලබා ගන්නා ලෙස දැනුම් දෙනු ලැබේ.

වැඩිදුර තොරතුරු සඳහා විද්‍යුත් තැපෑල (inquiries@iesl.lk), දුරකථන (011-2698426 Ext. 210 / 211) හෝ ආයතනයට පැමිණෙන්නේනම් සෑම සිකුරාදා දිනකම පෙරවරු 9.00 සිට පස්වරු 5.00 දක්වා අධ්‍යාපන අංශයේ විශේෂ කවුන්ටරය මගින් විමසන්න.

ඉහත සදහන් අවශ්‍යතාවයන් දැනට පවතින නිර්නායකයන් වන අතර IESL අභිමතය පරිදි වෙනස් විය හැක.

**ප්‍රධාන විධායක නිලධාරි/ විධායක ලේකම්**
**ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය**
**120/15, විජේරාම මාවත, කොළඹ 07.**